**පොලිස් ත්‍යාග අරමුදල -2014**

**පොලිස් ත්‍යාග අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, පොලිස් ආඥාපනතේ (65 අධිකාරිය) 74 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අරමුදලේ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරිමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා**

යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් අනුග්‍රාහක අරමුදලට සහ අපරාධ අංශයට ලබා දී තිබුණු පිළිවෙලින් රු. 2,000,000 ක් හා රු. 3,000 ක් වූ අත්තිකාරම් වර්ෂ 15 කට වැඩි කාලයක සිට හිඟ හිට පැවතුණි. එම අත්තිකාරම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟහිට පැවති එකතුව රු. 1,371,166 ක් වූ ලැබිය යුතු උසාවි දඩ මුදල් 2014 අප්‍රේල් 30 වනවිටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) 2001 වර්ෂයට අදාළව එකතුව රු. 32,048,586 ක්වූ විශේෂ ත්‍යාග නෛතික ක්‍රියාමාර්ග සිදුකරමින් පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය දක්වා අදාළ නිලධාරීන්ට ගෙවා නොතිබුණි.

**2.3 චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

**2006 දෙසැම්බර් 22 දිනැති අංක පී එෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.**

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 893,780,700 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.993,687,966 ක් විය.ඒ අනුව රු. 99,907,266 කින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල පිරිහීමක් විය. එය විශ්ලේෂණය කර පහත දැක්වේ.**

| | 2014 | 2013 | ප්‍රවර්ථන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයට බලපෑම හිතකර / (අහිතකර) |
|---|---|---|---|
| <u>ආදායම</u> | රු. | රු. | රු. |
| උසාවි දඩ | 648,001,235 | 832,871,950 | (184,870,715) |
| මෝටර් වාහන දඩ | 444,230,576 | 115,553,898 | 328,676,678 |
| ත්‍රස්ත විමර්ශන ඒකකය | 11,440,434 | 13,004,477 | (1,564,043) |
| ආයෝජන මත ආදායම | 386,092,184 | 433,524,367 | (47,432,183) |
| වෙනත් ආදායම | - | 35,899,700 | (35,899,700) |
| මුළු ආදායම | 1,489,764,429 | 1,430,854,392 | 58,910,037 |
| අඩුකළා-වියදම | | | |
| ත්‍යාග සහ විනෝදාත්මක කාර්යයන් | (595,787,679) | (436,966,226) | (158,821,453) |
| පරිපාලන වියදම් | (196,050) | (200,200) | 4,150 |
| | 893,780,700 | 993,687,966 | 99,907,266 |

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්ය සාධනය**

**ත්‍යාග ගෙවීම**

**සමාලෝචිත වර්ෂයේදී කරන ලද ත්‍යාග ගෙවීම් පෙර වර්ෂ දෙක සමඟ සසඳා පහත දැක්වේ.**

| | | 2014 | | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|---|---|
| | | මුදල | පුද්ගලයන් සංඛ්‍යාව | මුදල | පුද්ගලයන් සංඛ්‍යාව | මුදල | පුද්ගලයන් සංඛ්‍යාව |
| | | රු.මිලියන | | රු.මිලියන | | රු.මිලියන | |
| (i) | පොලිස් නිලධාරීන්ට ත්‍යාග ගෙවීම් | **415.3** | **ඉදිරිපත් කර නොතිබුණි.** | **422.7** | **275,076** | **585.2** | **396,287** |
| (ii) | පොලිස් නිලධාරීන් හා සිවිල් පුරවැසියන් සඳහා ගෙවන ලද විශේෂ ත්‍යාග | **1.8** | **ඉදිරිපත් කර නොතිබුණි.** | **2.1** | **පොලිස් නිලධාරීන් 262 සහ සිවිල් පුරවැසියන් 18** | **33.1** | **පොලිස් නිලධාරීන් 1,160 සහ සිවිල් පුරවැසියන් 72** |
| (iii) | පොලිස් නිලධාරීන්ට ගෙවන ලද මෝටර් ප්‍රවාහන ත්‍යාග | **163.1** | **ඉදිරිපත් කර නොතිබුණි.** | - | - | - | - |

**සමාලෝචිත වර්ෂය තුළ පොලිස් නිලධාරීන්ට හා සිවිල් පුරවැසියන්ට ත්‍යාග ගෙවීම් සිදුකර තිබුණද, ත්‍යාග ගෙවීම් ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලන**

**විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පොලිස්පතිවරයාගේ අවධානයට යොමුකරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.**

**(අ) ත්‍යාග ගිණුම්කරණය**

**(ආ) ත්‍යාග ගෙවීම පිළිබඳ පාලනය.**

**(ඇ) ස්ථාවර තැන්පතුවල ආයෝජනය**

**(ඇ) ලේඛන පවත්වා ගැනීම.**